

දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ වප් අව පැළවිය ලත් ගනි දින | කාණ්ඩය 111 | පත්‍රය 272 | පිටු 20 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 ඔක්තෝබර් 31 සෙනසුරාදා

සදාතනික පත්තර තාරුණ්‍යය අද පත්‍රය සමග

නිරෝධායනය වන පවුල්වලට රු.10,000 බඩු මල්ල නිවෙසටම

...ත්තුවෙන් නිවාසවලම ...ය වන පවුල් සඳහා ...ල්ලක් ඔවුන්ගේ නිවාස ... වැඩපිළිවෙළක් රජය ...දිරිදුතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී 27 වැනිදා පැවති සාකච්ඡාවේදී එළැඹි තීරණයකට අනුව බෙදාහැරීමට නියමිත මෙම බඩු මල්ල යුද හමුදාවේ සහාය ඇතිව නිවාස වෙත යැවීමට නියමිත බව රජයේ ආරංචි මාර්ග කියයි.

පිට 06

නිවෙසේ සිට වැඩ කිරීම යළි අරඹන්න

ජනපති ලේකම්ගෙන් චක්‍රලේඛයක්

නුවන් කොඩිකාර

කොරෝනා වයිරස ව්‍යාප්තිය පාලනය කරනු පිණිස 'නිවෙසේ සිට වැඩ කිරීමේ ක්‍රමය' යළි ක්‍රියාත්මක කරන්නැයි චක්‍රලේඛනයක් නිකුත් කරමින් ජනාධිපති ලේකම්, ආචාර්ය පී. බී. ජයසුන්දර මහතා බස්නාහිර පළාතේ සහ සෙසු ප්‍රධාන නගරවල රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ට නියම කර තිබේ.

පිට 06

කොවිඩ් ආසාදිත ගණන 10,000 ඉක්මවයි

නුවන් කොඩිකාර, සුභාෂිණී සේනානායක

කිලිනොච්චිය දිස්ත්‍රික්කය හැර සෙසු දිස්ත්‍රික්ක 24න්ම ඊයේ (30) උදෑසන වන විට වාර්තාගත සමස්ත ආසාදිත සංඛ්‍යාව 10,105ක් බවත්, ඉන් පුද්ගලයන් 5804ක් තවදුරටත් රෝහල්ගතව ප්‍රතිකාර ලබන බවත් කොවිඩ් -19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය පවසයි.

පිට 06

ඇඳිරි නීතිය කැඩූ 1259ක් පොලිස් භාරයට

සුභාෂිණී සේනානායක, රක්ෂණ ශ්‍රියන්ත

නිරෝධායන ඇඳිරි නීතිය පැනවූ පසුගිය 04 දා සිට මේ දක්වා කාලය තුළ නිරෝධායන ඇඳිරි නීතිය උල්ලංඝනය කළ පුද්ගලයන් 1259 දෙනකු සහ වාහන 178ක් පොලිස් භාරයට ගෙන ඇත.

පිට 06

සමෘද්ධි නිලධාරිනියකට කොරෝනා

දෙපාර්තමේන්තුව තාවකාලිකව වසා දමයි

මහින්ද අලුත්ගෙදර

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරිනියකට කොවිඩ් 19 වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වීමත් සමග එම දෙපාර්තමේන්තුව තාවකාලිකව වසා දැමීමට පියවර ගත් බව සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්, නීතිඥ බන්දුල තිලකසිරි මහතා 'දිනමිණ' ට කීය.

පිට 06

විදේශ ණය ගෙවීම පැහැර හරින්නේ නෑ

මහින්ද අලුත්ගෙදර

කුමන තත්වයක් යටතේ වුවද ශ්‍රී ලංකාව විදේශ ණය ගෙවීම් පැහැර නොහරින බවට විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා ලෝක බැංකු නියෝජිතයින් හමුවේ සහතික වෙයි.

පිට 06

නිරෝධායන ඇඳිරි නීතිය කඩා කොළඹ හෝටලයක විවාහ උත්සවයක්

පිට 06

බස්නාහිර පළාතේ පොලීසිවල 43ක් ආසාදිතයි

සුභාෂිණී සේනානායක, රක්ෂණ ශ්‍රියන්ත

කොළඹ අපරාධ කොට්ඨාසයට (CCD) අනුයුක්තව සේවය කරන පොලිස් නිලධාරීන් 15 දෙනකු කොවිඩ් 19 වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු වී ඇත. බස්නාහිර පළාතේ ආසාදිතයන් බව හඳුනාගෙන ඇති සමස්ත පොලිස් නිලධාරීන් ප්‍රමාණය 43කි.

පිට 06

යළි හිස ඔසවා ඇති කොවිඩ්19 වසංගතය පාලනය කිරීම සඳහා බස්නාහිර පළාතට පනවා ඇති ඇඳිරි නීතිය හේතුවෙන් කොළඹ නගරය ජනශූන්‍ය වී ඇති අයුරු

ඡායාරූපය නිශංක ද සිල්වා

දේශපාලන පළි ගැනීම් සෙවූ ජනාධිපති කොමිසමේ අවසන් වාර්තාව නොවැම්බර් මුල් සතියේ ජනපතිට

රෝෂන් තුෂාර

2015 ජනවාරි මස 8 දින සිට 2019 නොවැම්බර් මස 16 වැනි දින අතර කාලයේදී පැවති යහපාලන ආණ්ඩු සමයේ සිදු වූ දේශපාලන පළි ගැනීම් සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසමේ නිර්දේශ ඇතුළත් අවසන් වාර්තාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට නොවැම්බර් මුල් සතියේ බාර දීමට නියමිතය.

පිට 06

පීසීආර් පරීක්ෂණ කරන මුවාවෙන් නිවැසියන්ට සිහි නැති කර රන් ආභරණ

බස්නාහිරින් පිට වූ අය සොයා මෙහෙයුමක්

එම්සීසී අත්සන් කළොත් ජනතාව පාරට බහිවි

නදී මාණික්කගේ

එම්සීසී ගිවිසුම අත්සන් කළ හොත් රටේ ජනතාව එයට එරෙහිව පාරට බහින බවට විශ්වාසයක් ඇති බවත් ලෝකයේ බලගතු රටවල අවශ්‍යතා ඉටු කිරීම සඳහා මිස රටේ සංවර්ධනය සඳහා 20න් ලබාගත් අධික ඒකාධිපති බලතල භාවිත නොකරනු ඇති බවත් ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක මහතා පසුගියදා පැලවත්ත පක්ෂ මූලස්ථානයේ පැවති මාධ්‍ය හමුවකදී පැවසීය.

පිට 06